# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 11,699—1959 මාර්තු 13 වැනි සිකුරාද—13.3.1959

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඬ කරන ලදි)


## II වැනි කොටස—අධිකරණ

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබාගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)


| | පිට | | පිට |
|---|---|---|---|
| සම්මත වූ පණත් ... ... ... | — | පිස්කල් විකිණීම් ... ... ... | — |
| ශ්‍රෙෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන | 107 | මුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| දිස්ත්‍රික් උසාවිවල හා ඊට පහළ උසාවිවල දැන්වීම් ... | — | නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... | — |
| වස්තුභංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... | — | නොතාරිස් ලැයිස්තුව ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන් පත් කිරීම් ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | — |


## ශ්‍රෙෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන

### ප්‍රකාශපත්‍රයයි

ශ්‍රී ලංකාවීපයේ ගරුකටයුතු උතුම්වූ සුප්‍රීම් උසාවියෙන් මට ලැබී තිබෙන ආඥාවක බලය කරණකොට ගෙණ මෙයින් ප්‍රකාශකරන්නේ නම් බස්නාහිර දිසාවේ ක්‍රිමිනෙල් නඩු විභාගය වෂී 1959ක්වූ මාර්තු මස 20 වෙනි දින පෙරවරු 11 පැය පටන් කොළඹ තිබෙන නඩු ශාලාවේ පවත්වන්ට යෙදෙනවා ඇත.—එහි යම් කාරණ ඇතුව සිටින සැමදෙනාම යටකී සථානයට යටකී වේලාවට ඇවිත් පෙණීසිටින්ට ඕනෑවත් ඇර අවසර ඉල්ලා ලබාගෙණ මිස එයින් පිටතට යන්ට නුපුළුවන් බවත් මෙයින් සැමදෙනාටම දන්වන්නෙමි.

ජී. පී. තම්බයියා,
බස්නාහිර දිසාවේ පිස්කල් වම්හ.

වෂී 1959 ක්වූ මාර්තු මස 5 දින,
කොළඹ පිස්කල් කන්තෝරුවේදිය.

### ප්‍රකාශනයයි

ශ්‍රී ලංකාවීපයේ ගරු ශ්‍රේෂ්ඨාධිකරණයෙන් මට ලැබී තිබෙන අධිකරණ විධානයක බලය පිට බස්නාහිර දිස්ත්‍රික්කය සඳහා එකී අධිකරණයේ අපරාධ නඩු වාරයක් වර්ෂ 1959ක් වූ මාර්තු මස 20 වන දින පෙරවරු 11ට කොළඹ අධිකරණ ශාලාවේදී පවත්වන්නට යෙදෙන බව මම මෙයින් ප්‍රකාශ කර සිටිමි.

තවද, ඉහත කී වේලාවට එකී සථානයට පැමිණ සිටින ලෙසත් අවසර ඉල්ලා ලබාගෙන මිස එතැනින් පිටවී නොයන ලෙසත් මේ නඩු වාරය හා සම්බන්ධකමක් ඇති සියලු දෙනාට ම මම මෙයින් නියම්කොට දැනුම් දෙමි.

එල්. බී. අභයරත්න,
ස. ප. පිස්කල්.

වෂී 1959 මාර්තු මස 10 වන දින,
රත්නපුර පිස්කල් කන්තෝරුවේදිය.

## විශෙෂ නිවේදනයයි

1959 මාර්තු 27 වැනි සිකුරාද ආණ්ඩුවේ නිවාඩු දිනයක් වන බැවින්, 1959 මාර්තු මාසයේ හතරවැනි සුමානයේ ගැසට් පත්‍රය, 1959 මාර්තු 26 වැනි බ්‍රහස්පතින්ද නිකුත් කරන බැවින්, එහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1959 මාර්තු 23 වැනි සඳුද පස්වරු 4ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්ට සැලැස්විය යුතු බව කාගේත් දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

1959 මාර්තු 10 වැනි දින,
කොළඹ
ආණ්ඩුවේ මුද්‍රණාලයේ දීය..

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.


ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී

107—ජේ. ඇන්. බී 1234—1,326 (3/59)